දුරකථන/தொலைபேசி இல./Telephone Nos.
අමාත්‍ය / அமைச்சர் / Minister } 2784832, 2784807, 2785617
ලේකම් / செயலாளர் / Secretary } 2784812
කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50, Fax: 2784846
විද්‍යුත් තැපෑල/மின்னஞ்சல்/E-mail : isurupaya@moe.gov.lk
ඔබේ අංකය / உமது இல. / Your No. } ..........................................

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education
"ඉසුරුපාය"
බත්තරමුල්ල.
"இசுருபாய"
பத்தரமுல்லை.
"Isurupaya"
Battaramulla.

පාසල් කටයුතු හා පෞද්ගලික පාසල් ශාඛාව
මගේ අංකය / எனது இல. / My No. } ........ED/01/12/10/11/01
දිනය / திகதி / Date } 2008.11. 03

චක්‍රලේඛ අංක – **2008/41**

පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
කොට්ඨාශ භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම පාසල්වල විදුහල්පතිවරුන් වෙත.

## ආදි ශිෂ්‍ය සංගම් හා වෙනත් සංගම්වල ක්‍රියාකාරකම්

ආදි ශිෂ්‍ය සංගම් සම්බන්ධයෙන් 1964.11.20 දින නිකුත් කර ඇති 1964 අංක 27 දරන චක්‍රලේඛය හා ඊට සංශෝධනයක් ලෙස 1995.06.21 දින නිකුත් කර ඇති චක්‍රලේඛ ලිපියට අමතර වශයෙනි.

02. පාසල්වල ක්‍රියාත්මක වන ආදි ශිෂ්‍ය සංගම් හා වෙනත් විවිධ සංගම් විසින් පාසල තුළ යම් යම් ව්‍යාපෘති සඳහා විදුහලට දරුවන් ඇතුළත් කිරීමේ දී හා පාසලේ ඉගෙනුම ලබන දරුවන්ගෙන් විවිධ ආකාරයට මුදල් එකතු කරන බව විගණන වාර්තා හා පැමිණිලි මගින් අනාවරණය වී ඇත.

03. ආදි ශිෂ්‍ය සංගම්/වෙනත් සංගම් විසින් පාසල තුළ හෝ බාහිරව සිසුන් යොදා ගනිමින් විවිධ ව්‍යාපෘති සඳහා මුදල්/භාණ්ඩ එකතු කිරීම හෝ ලබා ගැනීම, පාසල් සිසුන්ගෙන්/දෙමාපියන්ගෙන් යම් යම් හේතු දක්වා මුදල්/භාණ්ඩ එකතු කිරීම හෝ ලබා ගැනීම වහාම ක්‍රියාත්මක වන පරිදි තහනම් කරනු ලැබේ. එසේම ඉහත සංගම් මගින් දෙමාපියන්ගෙන් හෝ සිසුන්ගෙන් සේවා සපයා ගැනීම ද තහනම් කරනු ලැබේ. මෙවැනි විවිධ සංගම්වලට පාසල තුළ මුදල්/භාණ්ඩ එකතු කිරීමට හෝ සේවා ලබා ගැනීමට නිලධාරීන් විසින් ද අනුමැතිය ලබා නොදිය යුතු ය.

04. අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ මගින් මුදල් එකතු කිරීමට බලය ලබා දී ඇති කරුණු හැර අනෙකුත් ව්‍යාපෘතීන් හා පාසලේ අවශ්‍යතාවයන්ට මුදල් එකතු කරන්නේ නම් එය පාසල් සංවර්ධන සමිතිය/පාසල් නගා සිටුවීමේ වැඩසටහන මගින් එම චක්‍රලේඛ නියමයන්ට අනුකූල වන පරිදි කළ යුතු ය.

05. මින් ඉදිරියට මෙම උපදෙස් පරයේ පිළිපැදීමට සියලු විදුහල්පතිවරුන් ක්‍රියා කළ යුතු ය. යම් විදුහලක එම උපදෙස්වලට පටහැනිව කටයුතු කර ඇති බව අනාවරණය වුවහොත් අදාළ විදුහල්පතිවරුන් එයට වගකිව යුතු බව අවධාරණය කරමි.

එම්.එම්.එන්.ඩී.බණ්ඩාර
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්

1. විගණකාධිපති
2. සභාපති, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
3. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය
4. ගණකාධිකාරී, අභ්‍යන්තර විගණන
5. අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලුම මාණ්ඩලික නිලධාරීන්